# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2166/5 - 2020 මාර්තු මස 10 වැනි අඟහරුවාදා - 2020.03.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

මධ්‍යම පළාතේ ආණ්ඩුකාර, ලලිත් යූ. ගමගේ වන මා විසින් 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2(1)(අ) වන වගන්තිය සමග කියවිය යුතු 252 වන අධිකාරය වන මහ නගර සභා ආඥා පනතේ 188(i) ක.ක. හා 289 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් නියෝග පනවනු ලැබේ. මෙම නියෝගය 2019.10.19 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

**නියෝග**

මධ්‍යම පළාතේ මහනුවර මහ නගර සභාවේ නගරාධිපතිවරයාට, නියෝජ්‍ය නගරාධිපතිවරයාට හා නගර සභා සභිකයෙකුට මාසිකව පවත්වන ස්ථාවර කාරක සභා හා අනු කමිටුවලට සහභාගිවීම වෙනුවෙන් ගෙවනු ලබන දීමනාවක් මහනුවර මහ නගර සභාවේ අරමුදලින් ගෙවීම. මෙම දීමනාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත 1391/25 හා 2005.05.06 දිනැති නියෝගවලට අතිරේක විය යුතුය.

1. අනු කමිටු දීමනාව - රු. 1,000
2. ස්ථාවර කාරක සභා දීමනාව - රු. 1,500 දක්වා වැඩි කිරීම

**නීතිඥ ලලිත් යූ. ගමගේ,**
ආණ්ඩුකාරවර,
මධ්‍යම පළාත.

2019 දෙසැම්බර් මස 18 වැනි දින,
ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

03-905

1A - PG 4924 - 107 (2020/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.